පුනරුත්ථාපන කාර්යාංශය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පුනරුත්ථාපන කාර්යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙලකිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සේනපුර හා කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථාන දෙකෙහි සිරමැදිරි 02ක් ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් ආයතනය වෙත වැඩිපුර ගෙවන ලද රු.545,490ක මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් යටතේ ලැබිය යුතු වටිනාකමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. තව ද, මෙම ඉදිකිරීම් දෙක වෙනුවෙන් වැඩිපුර ගෙවන ලද වටිනාකම ගොඩනැගිලි ගිණුමට හර වී තිබූ බැවින්, එම අගයෙන් දේපළ පිරියත හා උපකරණ වැඩියෙන් දක්වා තිබුණි.	2025 පෙබරවාරි 27 දින ඉදිකිරීම් ආයතනය වෙත බැරකර ඇති අතර, 2025 වර්ෂය තුළ ගොඩනැගිලි ගිණුමට බැරකර නිවැරදි කරන බව.	වැඩිපුර ගෙවීම් ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු ය.
(ආ)	ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල කුලියට ලබාගැනීම වෙනුවෙන් ගෙවන ලද ආරක්ෂිත තැන්පතු මුදල වන රු.5,832,000ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර, එය සටහනක් මගින් පමණක් දක්වා තිබුණි.	2023 වර්ෂයේ කාර්යාංශය පවරාගැනීමට පෙර ගෙවූ මුදලක් බැවින්, ජංගම වත්කමක් ලෙස පෙන්විය නොහැකි බවත්, එම මුදල භාණ්ඩාගාරයට ගෙවිය යුතු බැවින් සටහන් මගින් පමණක් පෙන්නුම් කළ බව.	ආරක්ෂිත තැන්පතු ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු ය.
(ඇ)	සමාජගත පුනරුත්ථාපනලාභීන් සඳහා බෙදාහැරීමට 2024 වර්ෂයේ මිලදීගෙන බෙදා නොහැර තිබුණු භාණ්ඩ හා උපකරණ වටිනාකම රු.3,614,459ක් සමාලෝචිත	2025 වර්ෂයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	බෙදා නොහැර ආයතනය සතුව පවතින තොග ජංගම වත්කම් ලෙස හඳුනාගත යුතු ය.

	වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග වටිනාකමට ඇතුළත්කර නොතිබුණි.		
(ඇ)	2014 වර්ෂයේ කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය සඳහා විදුලි සැපයුම ලබාගැනීම වෙනුවෙන් ගෙවන ලද රු.19,133,235ක මුදල ජංගම නොවන වත්කම් ලෙස ප්‍රාග්ධනිතකර නොතිබුණු අතර, ආරක්ෂක තැන්පතු මුදල වන රු.1,000,000ක් ජංගම වත්කම් යටතේ හඳුනාගෙන නොතිබුණි.	විදුලි සැපයුම ලබාගැනීමේ වියදම 2025 වර්ෂයේ ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත්, ආරක්ෂිත තැන්පතුව ගෙවූ බවට මුල් පිටපත් නොමැති බැවින්, ජංගම වත්කම් යටතේ ගිණුම්ගත නොකළ බව දන්වා ඇත.	ආරක්ෂිත තැන්පත් ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු ය.
(ඉ)	වැඩ නිමකරන ලද ව්‍යාපෘති 04ක් වෙනුවෙන් වර්ෂය තුළ ගෙවන ලද කළමනාකරණ ගාස්තු ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණු රු.1,426,621ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගොඩනැගිලි ගිණුමට හරකළ යුතු වුවත්, වෙනත් වියදම් ගිණුමට හරකර තිබුණි.	2025 වර්ෂයේ නිවැරදි කරන බව.	කළමනාකරණ ගාස්තු ප්‍රාග්ධනිත කළ යුතු ය.
(ඊ)	ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට ගොඩනැගිලි නමින් ගළපා තිබුණු රු.258,958,663ක වටිනාකම් 04ක් පිළිබඳ අගය තහවුරු කිරීම් ලබාගැනීම පිණිස විගණනයට ඉදිරිපත් කරන ලද ලේඛනවලට අනුව එම වටිනාකම රු.262,890,731ක් විය. ඒ අනුව ගොඩනැගිලි වටිනාකම අදාළ ලේඛන හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් අතර රු.3,932,068ක වෙනසක් පැවතුණි.	2025 වර්ෂයේ ප්‍රාග්ධනිත කර ඊට අදාළ ක්ෂය ගැළපීම ද කරන බව.	නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු ය.

1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ලිපිද්‍රව්‍ය තොග	35,350,452	36,360,948	(1,010,496)	වර්තමානය වන විට නිවැරදි කිරීම්කර ඇති බව.	නිවැරදි තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතු ය.

(ආ)	ඉන්ධන හා සලාක මුළු වටිනාකම	179,819,303	176,330,279	3,489,024	නිවැරදි කිරීම් කිරීමේ දී නිසිපරිදි යුධහමුදා සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් යාවත්කාලීන නොකිරීම මත පරස්පරතාවයන් ඇති වී ඇති බව.	සැසඳීම්කර නිවැරදි වටිනාකම හඳුනාගැනීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	සලාක හා ඉන්ධන වෙනුවෙන් ගෙවිය යුතු වටිනාකම	14,729,779	44,014,182	29,284,403	කාර්යාංශයේ අවශ්‍යතා සඳහා සපයාගනු ලබන ඉන්ධන හා සලාක ඇතුළත් වාර්තාවක් යුධහමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන අතර, එහි වටිනාකම් නිසිපරිදි යුධහමුදා මගින් යාවත්කාලීන නොකිරීම මත අදාළ පරස්පරතාවයන් සිදුව ඇත.	සැසඳීම්කර නිවැරදි වටිනාකම තහවුරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය.

1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	**මුදල රු.**	**නොසැපයූ විගණන සාක්ෂි**	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ස්ථාවර වත්කම්	24,734,718	වත්කම් ලේඛන	ගොඩනැගිලි වටිනාකම රු.1,248,788ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර ඇති අතර, එය 2025 වර්ෂයේ නිවැරදිව ගිණුම්ගත කරන බවත්, 2010 – 2014 තුළ දරා ඇති ඉතිරි වියදම් සඳහා රේඛීය අමාත්‍යාංශය ගෙවීම්කර ඇති බැවින්, ඊට අදාළ ලේඛන අමාත්‍යාංශය සතු බවත් දන්වා ඇත.	ස්ථාවර වත්කම්වල වටිනාකම සනාථ කිරීමට තහවුරු කිරීම් විගණනය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ)	තොග	46,895,368	තොග ආගණන වාර්තා	ඉදිරි කාල පරිච්ඡේදය සඳහා තොග ආගණනයක් සිදු කරන බව.	තොග ආගණනය සිදුකර තොග වටිනාකම සනාථ කළ යුතු ය.

1.6 නීතිරීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීතිරීති රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 ඡේදය	උපාය මාර්ගික සැලැස්මක් පිළියෙලකර රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා හරහා භාණ්ඩාගාර ලේකම් සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාංශය විසින් එවැනි උපායමාර්ගික සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.	කෙටුම්පත් සකස්කර ඇති අතර, පාලක සභා අනුමැතිය ලබාගෙන ඉදිරිපත් කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය	මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා ගිණුම් වර්ෂය අවසාන වී දින 60ක් තුළ ලබාදිය යුතු වුව ද, එය විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2025 අප්‍රේල් 17 වන දින දී ය.	ගිණුම් පිළියෙලකර තිබුණ ද, පාලක මණ්ඩල කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් අනුමැතිය ලබාගැනීමට නොහැකි වීම.	මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඇ)	**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**			
	(i) 4.2.1(ආ) ඡේදය	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගතකර තිබිය යුතු වුවත්, කාර්යාංශය විසින් 2024 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි 2024 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන කටයුතු පමණක් අන්තර්ගතකර තිබුණි.	ඉදිරියේ දී අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(ii) 4.2.2(අ) ඡේදය	එක් එක් ප්‍රසම්පාදනය ආරම්භයේ සිට අවසානය දක්වා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් කාර්යාංශය විසින් 2024 වර්ෂය සඳහා පිළියෙලකර නොතිබුණි.	මාර්ගෝපදේශ ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.72,013,067ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.66,389,263ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,623,804ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රදානයන් ලැබීම්හි අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 අංක 02 දරන පුනරුත්ථාපන කාර්යාංශ පනතේ 4(ආ) ඡේදය ප්‍රකාරව ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින්නන් වෙනුවෙන් එම සේවාව ලබාදීම කාර්යාංශයේ කාර්යය හා කර්තව්‍යයට ඇතුළත් වුවත්, 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට එය ඇතුළත්කර ක්‍රියාත්මක කිරීමට කටයුතුකර නොතිබුණි.	ස්වෙච්ඡාවෙන් පුනරුත්ථාපනය සඳහා යොමුවන පුනරුත්ථාපනලාභීන් හට පුනරුත්ථාපන මධ්‍යස්ථාන අලුතින් ආරම්භ කිරීමට පියවරගෙන ඇති අතර, අනුමැතිය ලැබීමෙන් පසු පුනරුත්ථාපන කටයුතු අරඹන බව.	ආයතනයේ අපේක්ෂිත කාර්යභාරය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් රු.86,564,294ක ප්‍රතිපාදන වෙන්කර තිබූ කාර්යයන් 05ක කිසිදු භෞතික හා මූල්‍ය ප්‍රගතියක් ළඟාකරගෙන නොතිබුණි.	අදාළ නොවන පිළිතුරු ලබා දී තිබුණි.	සැලසුම් කළ කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	2024 වර්ෂය තුළ රැඳවියන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා 13ක් පවත්වා තිබුණු අතර, ඒ සඳහා රු.11,169,157ක වියදමක් දරා තිබුණි. වර්ෂය තුළ වෘත්තීය පුහුණු පාඨමාලා හදාරා පුහුණුව ලබාගත් රැඳවියන් සංඛ්‍යාව 314ක් වුව ද, පුහුණුවට අදාළ රැකියාවල නිරත සංඛ්‍යාව 36ක් හෙවත් සියයට 11.5ක අඩුඅගයක් විය.	වෘත්තීය පුහුණුවට අදාළ රැකියා සඳහා යොමුවීම අඩුවක් පෙන්වන්නේ පෙර කළ රැකියා සඳහා යොමුවීම වුවත්, දෛනික ජීවිතයට පුද්ගලික සංවර්ධනයට මෙන්ම රැකියා සඳහා සුදුසුකම් සපුරාගැනීමට පාඨමාලා හේතු වී ඇති බව.	අපේක්ෂිත අරමුණු කරා කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතු ය.

(ඇ)	2024 වර්ෂයේ පුනරුත්ථාපනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව 820ක් වී තිබුණු නමුත්, නැවත මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් සංඛ්‍යාව 134ක් ද, නැවත සිරගත වූවන් සංඛ්‍යාව 27ක් ද විය. වර්ෂය තුළ පුනරුත්ථාපන කටයුතු සඳහා රජය දරා තිබුණු මුළු වියදම රු.591,807,915ක් වුව ද, රැඳවියන් පුනරුත්ථාපනය කිරීමේ අපේක්ෂිත අරමුණු මේ අනුව නිසිපරිදි ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.	පුනරුත්ථාපනයකර නැවතත් ඔවුන් එම පරිසරය වෙතම මුදා හැරීමට සිදුවීම, බලපා ඇති බව.	පසුවිපරම් කටයුතු ක්‍රියාත්මක කිරීම වැඩි කළ යුතු ය.
(ඉ)	කාර්යාංශය සතු ඩිෆෙන්ඩර් රථයක්, ජීප් රථයක් හා යතුරු පැදියක් අපහරණය කිරීමට සමීක්ෂණ මණ්ඩලය නිර්දේශකර තිබුණ ද, ඒ සඳහා අවශ්‍ය කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි.	පාලක සභා නිර්දේශ ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශය මගින් දන්වා තිබුණ ද, නව පාලක සභාව පත්වීම ප්‍රමාදවීම.	සමීක්ෂණ මණ්ඩලය නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඊ)	2024 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2024හි 11.4 වගන්තිය අනුව නිලවාහනයක් ලැබීමට සුදුසුකම් ලද නිලධාරියෙකු ඕනෑම සේවා නියුක්තියක් යටතේ රජයට අයත් ආයතන කිහිපයක සේවය කළ ද, එම නිලධාරියා සඳහා එක් වාහනයක් පමණක් සැපයිය යුතු ය. සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ඉන්ධන සහ රියදුරු සමග කොමසාරිස් පාලන (කාර්යාංශ මූලස්ථානය), පුනරුත්ථාපන අධිකාරී සාරංගා මධ්‍යස්ථානය - වවුනියාව සහ කොමසාරිස් පුනරුත්ථාපන (කාර්යාංශ මූලස්ථානය) යන නිලධාරින් වෙත ලබාදී තිබියදී, පුනරුත්ථාපන කාර්යාංශය විසින් ද වෙන්කළ වාහන 03ක් ඉහත නිලධාරින්ට ලබාදීමට කටයුතුකර තිබුණි. තව ද, මෙම වාහන 03න් එක් වාහනයක් කුලී පදනම මත ලබාගෙන තිබූ බැවින් එම වාහනය සඳහා රු.1,196,200ක් කුලී වශයෙන් ද, එම සමස්ථ වාහන 03 සඳහා ඉන්ධන වියදම ලෙස රු.3,479,464ක් ද වැය කිරීමට සිදු වී තිබුණි.	කාර්යාංශය අදාළ නිලධාරින්ගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා පමණක් ලබා දී ඇති බව.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කන්දකාඩු, සේනපුර හා වවුනියා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල රැඳවියන් සඳහා පහසුකම් සැලසිය හැකි ප්‍රමාණය පිළිවෙලින් 500, 500 හා 120ක් වුව ද, 2024 දෙසැම්බර් 31 දිනට සිටි රැඳවියන් සංඛ්‍යාව පිළිවෙලින් 101, 79 හා 82ක් වූයෙන් තවදුරටත් 858දෙනෙකු සඳහා පහසුකම් සැලසිය හැකිව තිබූ බැවින්, මධ්‍යස්ථානවල මානව හා භෞතික සම්පත් උපරිම අයුරින් උපයෝජනය වී නොතිබූ බව නිරීක්ෂණය විය.	අධිකරණ මගින් මධ්‍යස්ථාන වෙත යොමුකිරීමේ අඩුවක් වන බැවින්, අධිකරණ දැනුවත්කර රැඳවියන් වැඩි ප්‍රමාණයක් පුනරුත්ථාපනය සඳහා යොමුකරන ලෙස ඉල්ලීම්කර ඇති බව.	උපරිම කාර්යක්ෂමතාවයෙන් සම්පත් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) අනුව රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදුකළ යුතු වුව ද, පුනරුත්ථාපනලාභීන් වෙනුවෙන් රු.2,860,000ක් වටිනා කළු වර්ණයෙන් යුතු දිග කලිසම් 1100ක් මිලදීගැනීම හා රු.1,374,825ක් වටිනා කරණවැමි වෘත්තීය සඳහා අවශ්‍ය උපකරණ කට්ටල 15ක් මිලදීගැනීම සඳහා එසේ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන්කර නොතිබුණි.	සියලු භාණ්ඩ නිසිපරිදි නියමිත ප්‍රමාණයෙන් ලද පසු පමණක් අදාළ ගෙවීම් කරන බවත්, 2025 මැයි 25 සිට සීමාව ඉක්මවන සියලු මිලදීගැනීම් සඳහා ගිවිසුමකට යටත්ව ඇණවුම් නිකුත්කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ආ)	පුනරුත්ථාපනලාභීන් වෙනුවෙන් කළු වර්ණයෙන් යුතු දිග කලිසම් 1,100ක් මිලදීගැනීමේ ප්‍රසම්පාදනය වෙනුවෙන් අවම මිලගණන් ඉදිරිපත් කරන ලද ආයතනය වෙත රු.2,860,000කට ප්‍රසම්පාදනය ප්‍රදානයකර තිබුණු අතර, දේශීය වශයෙන් භාණ්ඩ සැපයීම සඳහා මිලගණන් ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු තබන්නන් එකතු කළ	ඉදිරියේ දී වැට් නිෂ්කාශන ලිපි හා ආයතන ලියාපදිංචි පනතින් ඉදිරිපත් කිරීම අනිවාර්යය බැව් මිලකැඳවීමේ ලේඛනවල සඳහන්කර එසේ නොමැති ආයතන ඇගයීම් සඳහා නොසලකා හරින බව සඳහන් කර තිබුණි.	අදාළ නීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

අගය මත බදු වෙනුවෙන් ලියාපදිංචි වී තිබිය යුතු බවත්, එසේ නොමැති නම් ගැසට් නිවේදනය අනුව ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් සහතිකකර ආයතනයේ නමට ලබාගත් සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු බව ලංසු ලේඛනයේ සඳහන් වුව ද, තෝරාගත් ආයතනය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතුකර නොතිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 267ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 65ක් වූයෙන් පුරප්පාඩු 202ක් පැවතුණි. මෙහිදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව 10ක් ද, තෘතියික මට්ටම තුළ 41ක් ද, ද්විතීක මට්ටම තුළ 105ක් හා ප්‍රාථමික මට්ටම තුළ 46ක් ලෙස ද පුරප්පාඩු පැවතුණු අතර, සමාලෝචිත වර්ෂයේ යුධ හමුදා නිලධාරී 46ක් හා ත්‍රිවිධ හමුදා සෙසු නිලයන් 361ක් ලෙස එකතුව 407ක් අනුයුක්තකර තිබුණි. මේ අනුව අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා 205දෙනෙකු ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුයුක්තකර තිබුණි.	පුරප්පාඩු සඳහා ස්ථිර පදනමට බඳවාගන්නා තෙක් ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුයුක්තකර ඇති අතර, උපදේශන රාජකාරී සඳහා බාහිර සම්පත්දායක සේවය ලබාගන්නා බව.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය.
(ආ)	පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි රාජකාරී සඳහා හමුදා නිලධාරීන් සහ සෙසු නිලයන් 358ක් මුදාහැරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබා දී තිබුණ ද, එම සංඛ්‍යාව ඉක්මවා හමුදා නිලධාරීන් හා සෙසු නිලයන් 49දෙනෙකු අනුයුක්තකර තිබුණි.	යුධ හමුදාවේ පවතින ප්‍රතිපත්ති හා රෙගුලාසි අනුව යුධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා අනුමත සෙසු නිල කාර්යමණ්ඩල 71දෙනෙකු කාර්යාංශය වෙත ඇතුළත්වීම.	අනුමැතීන්ට යටත්ව කටයුතු කළ යුතු ය.
(ඇ)	ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩලයෙන් මූලස්ථාන කාර්යාංශය සඳහා ලිපිකරු රාජකාරී සඳහා 83දෙනෙකු ද, පොදු රාජකාරී සඳහා	පාලක සභාව අවධානය යොමුකර ඇති අතර, කාර්ය මණ්ඩලය පිළිබඳ නැවත අධ්‍යනය කරන බව.	අනුමත තනතුරු සඳහා අනුයුක්ත කළ යුතු ය.

	37දෙනෙකු ද, අනුයුක්ත කිරීමේ අවශ්‍යතාවය විගණනයට පැහැදිලි නොවුණි.		
(ඈ)	ආරක්ෂක අමාත්‍යාංශය මගින් උපදේශන රාජකාරී සඳහා නිලධාරීන් 15ක් හා සෙසු නිලයන් 35ක් සේවයේ යොදවා තිබුණ ද, වර්ෂය තුළ බාහිර උපදේශන නිලධාරීන් වෙනුවෙන් රු.31,045,395ක් ගෙවා තිබුණි.	බඳවාගැනීමට අනුමැතිය ලැබී නොමැති බැවින්, බාහිර උපදේශකයන්ගේ සේවය ලබාගන්නා බව.	කාර්යමණ්ඩලය බඳවා ගැනීමට හා අනුයුක්ත කර ඇති නිලධාරීන්ගෙන් සේවය ලබාගැනීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අනුයුක්තකර ගැනීමට යටත්ව වෛද්‍ය නිලධාරීන් 03දෙනෙකු, හෙද නිලධාරීන් 06දෙනෙකු සහ ඖෂධවේදීන් 03දෙනෙකු ලෙස එකතුව 12දෙනෙකු අනුමතකර තිබුණ ද, මෙතෙක් එම කාර්යමණ්ඩලය ලබාගැනීමට කටයුතුකර නොතිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල ඌණතාවය පවතින බැවින්, සෞඛ්‍ය අමාත්‍යාංශය අනුයුක්තකර නොමැති බව.	අනුමත තනතුරු පිරවීමට කටයුතු කළ යුතු ය.